කාර්යාලය /அலுவலகம் / Office :
දුරකථන
தொலைபேசி
Telephone
} 0112034347
ෆැක්ස්
பெக்ஸ்
Fax
} 0112887422
විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail
} agriculturemedia@gmail.com

මාධ්‍ය ඒකකය
ஊடகப் பிரிவு
MEDIA UNT

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

මගේ අංකය
எமது இல.
My No. }

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } **2026.02.10**

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ,**

**<u>කෘෂිකර්මාන්තයේ දියුණුව වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව ගමනක් යාමට සූදානම් වෙයි.</u>**

**ඉදිරියේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව දැනුම්වත් කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය තුෂාර වික්‍රමාරච්චි මහතා ඊයේ (09) දින පේරාදෙණියේදී අදහස් පළ කළේය.**

**"ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයට ආයතන 2ක් එකතු වෙලා ඒකාබද්ධ ප්‍රවේශයකට ඇවිත් කොහොමද රටේ කෘෂිකර්මාන්තය දියුණු කරන්නේ කියලා. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට වැඩ කරන ආයතන ගණනාවක් තියෙනවා. අපි අනාදිමත් කාලයක ඉඳන් තනි තනිව තමයි කෘෂිකර්මාන්තයට වැඩ කරලා තියෙන්නේ. අපි අත්දැක්කා අපට එකතු වෙලා මේ ගමන යන්න පුළුවන් නම් ලොකු දුරක් යන්න පුළුවන් සහ කෘෂිකර්මාන්තය වෙනුවෙන් සැහෙන වැඩක් කරන්න පුළුවන් කියලා. ඒ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ක එකතු වෙලා අපි සාකච්ඡා කරගත්තා ඉදිරියේදී අපි දෙපාර්තමේන්තු දෙකම එකම ප්‍රවේශයකින් එකම විදිහට සහයෝගයෙන් කටයුතු කරමු කියලා. මෙතනදි විශේෂයෙන් අපි සාකච්ඡාවට බඳුන් කළේ අපේ කෘෂිකර්මාන්තයේ තියෙන වී වගා වපසරියන් සහ වෙනත් බෝගවල වගා වපසරියන් නිෂ්පාදනය ආදී කරුණු අපට අවශ්‍ය වෙනවා ශ්‍රී ලංකාවේදී ප්‍රතිපත්තිමය තීරණ ගන්න. උදාහරණයක් විදිහට ගත්තොත් ජනාධිපති ලේකම් කාර්යාලයට අනුබද්ධව තියෙන ආහාර ප්‍රතිපත්ති සහ ආහාර සුරක්ෂිතතා කමිටුවක්. මෙතනදි ගොවිජනතාව ආරක්ෂා කරමින් පාරිභෝගිකයා ආරක්ෂා කරමින් ජාතියට වැදගත් වන තීන්දු තීරණ ගන්නවා. මෙතනදි අපි කාලයක් තිස්සේ දැකපු දෙයක් තමයි මේ දත්තවල තියෙන අඩුපාඩු. මේක මඟ හරවාගෙන ඉදිරියට යන්න අපි දෙගොල්ලෝ එකට එකතු වෙලා සාකච්ඡා කරනවා.**

**අනිත් එක තමයි අපේ ආයතන දෙක කෘෂිකර්මාන්තයේ දියුණුව වෙනුවෙන් ගොඩක් වැඩ කරනවා. බිම් මට්ටමේ අපිට ලොකු සෙනඟක් ඉන්නවා. නිලධාරී මඩුල්ලක් ඉන්නවා. අපි ඉදිරියේදී එකම ඉලක්කයකින් එකම අධිෂ්ඨානයකින් වැඩ කරනවා ලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුව වෙනුවෙන්. අපේ ආයතන දෙකම එකතු වෙලා ගමනක් යන එක තමයි අපේ මේ ව්‍යායාමය."**

**මෙහිදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ධම්මික රණතුංග මහතා ද මෙම වැඩපිළිවෙල සම්බන්ධයෙන් අදහස් පළ කළේය.**

**"අපි ඉතාමත් වැදගත් වැඩකොටසකට තමයි මුලපිරුවේ. අපි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ ප්‍රවේශයකින් කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා වැඩ කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳ ඇති කරගත්ත කථිකාව. අපේ දෙපාර්තමේන්තු දෙකම දීර්ඝ ඉතිහාසයක් තියෙන රටේ සංවර්ධනයට ඉතා වැදගත් දායකත්වයක් සපයන දෙපාර්තමේන්තු දෙකක්. නමුත් අපට අනන්‍ය වූ ක්‍රියාපටිපාටියක් තියෙනවා. සුවිශේෂී කාර්යභාරයන් තියෙනවා.**

හැබැයි මේ සියලු කාර්යභාරයන්වල අවසානයේ අපි බලාපොරොත්තු වෙන්නේ කෘෂිකර්මාන්තය සංවර්ධනය කරන්න සහ ගොවිජනතාවගේ නිෂ්පාදන වැඩි කරලා සමස්ත නිෂ්පාදනය වැඩි කරන්න.ඒ තුළින් ගොවිජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න. මේ කාර්යය සඳහා අපේ දෙපාර්තමේන්තු දෙකම ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරන්නේ කොහොමද, ඒ තුළින් අපේ ශක්තීන් වඩාත් හොඳින් එකතු කරලා ගොවිජනතාවට වඩාත් හොඳින් සේවය කරන්නේ කොහොමද කියන කාරණය සාකච්ඡා කරන්න අපි අද එකතු වුණා. මේක ආරම්භයක් පමණයි. මේ සාකච්ඡාව දිගටම පවත්වාගෙන ගිහිල්ලා වඩාත් හොඳ ප්‍රවේශයකින් කෘෂිකර්මාන්තයට සේවය කරන්න අපේ දෙපාර්තමේන්තු දෙකම අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමින් කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවිජනතාවට වැදගත් වන ප්‍රතිපත්තිමය තීරණ ගන්න සහ ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් ගත යුතු තීරණ ගන්න අවශ්‍ය පසුබිම සැකසීම සඳහා අපේ දෙපාර්තමේන්තුවලට එකතුවෙලා කටයුතු කරන්න පුළුවන් කොහොමද සහ අපේ සංවර්ධන වැඩසටහන් එකට එකතු කරන්නේ කොහොමද කියලා අපි සාකච්චා කළා.”

මාධ්‍ය ඒකකය
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**077 - 7298449**